

මහමෙරක් තරම් ආදරය තියාගෙන
ආදරය නොපෙන්වූ පිරිමින්ට
නොපෙන්නූ ආදරයත් විඳ දරාගෙන
සාගරයක් තරම් ආදරයක් දුන් ගැහැනුන්ට

හෝ ලුසී ලුසී

ප්‍රථම මුද්‍රණය : 2024 දෙසැම්බර්

හෝ ලූසී ලූසී

2024 © Muthumudalige Nissanka

ISBN 978-624-5552-23-8

මුද්‍රණය - එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්

නො 27/18 ජයන්ත වීරසේකර මාවත,

කොළඹ 10.

සෝදුපත් පරීක්ෂාව - අශෝක කුලතුංග

පරිගණක පිටු සැකසුම - කාවින්ද්‍යා රත්නායක

කවර නිර්මාණය - ප්‍රදීප් ප්‍රේමලාල්

ප්‍රකාශනය - පොත්මී ප්‍රකාශන

මෙම පොතෙහි සියලුම හිමිකම් ඇවිරිණි. කර්තෘගේ අවසරය නිසි පරිදි ලිපියකින් නොලබා මෙහි එන කිසිවක්ම, මොනම ආකාරයකින්වත් නැවත පළ කිරීම තහනම් වේ. එම තහනමට: අතින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, වීඩියෝ හෝ ඕඩියෝ ලෙස නිර්මාණය කිරීම,

ඊ -බුක් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුළත් බව සලකන්න.

සියලුම හිමිකම් ඇවිරිණි. මුතුමුදලිගේ නිශ්ශංක 2024

මෙම කෘතිය පීඩීඑෆ් ලෙස බෙදාහැරීම සපුරා තහනම් බැවින් මෙය පීඩීඑෆ් කර තිබුණහොත් ඊට විරුද්ධව නීතීමය පියවර ගැනීම සඳහා පහත අංකය ඔස්සේ කරුණාකර පොත්මී වෙත දන්වන්න.

0776882324 / publisher@pothmee.com / nissh@proton.me

'මම හිතන්නේ අපිට ජීවිතේ ගැන හීන දකින්නවත් අයිතියක් නෑ,

ඔයා ඒ දකින හීනෙට ඔයා මේ ගත කරන මොහොතේ තියෙන සුන්දරත්වයත් බොඳ කරලා දාන්න පුළුවන් නම් ඒ හීනේ දකින්න එපා මිත්‍ර,

ඔයා ඒ හීනේ දකින්නැතිව මේ ලැබිලා තියෙන මොහොතේ විතරක් ජීවත් වෙන්න, අද අපි සතුටින් ඉඳලා හෙට යළිත් අවදි වුණොත් අපි ඒ දවසට ආයෙමත් ස්තුති කරමු... ඒ ඇති... ඊට වඩා එහාට කිසිම දෙයක් හිතන්න එපා'

එයා මට ඒ ටික කිවුවේ මම හීන දකිනවට තියෙන අකමැත්ත නිසා නෙමෙයි එයා ඒක කිවුවේ, මම ජීවිතේ ගැන අනවශ්‍ය විදියට හිතන නිසා.

'ඒ නිසා මම හීන දැක්කේ නෑ ලුසී, මම පුළුවන් තරම් උත්සහා කළේ ඔයත් එක්ක අපි දෙන්නට ලැබිලා තිබුණු ඒ පුංචි මොහොතවල් ටික සතුටින් ගත කරන්න... ඔයා නිසා ම මම බලාපොරොත්තුවලින් ඈත් වෙලා සතුට එකතු කරන්න පටන් ගත්තා...'

'අපි ගොඩක් සතුට එකතු කළානේ, මතක ද ඔයාට?'

මේ මොහොතෙත් ඇස් දෙක වහගෙන මගේ පපුවට ඇහුම්කන් දුන්නොත් මට ඒ සතුටේ හැම අංශු මාත්‍රයක් ම ආයේ ආයේත් විඳින්න පුළුවන්.

ඒත් මොකටද ලුසී...

ඔයා එකතු කරපු සතුටත් මට ම දීලා ඔයා අද යන්න ම ගිහින් නම්....

මම මොකටද ඒ සතුට මගේ පපුවෙ ම තියාගෙන ජීවත් වෙන්නේ?

අපි දෙන්නා එකතු කරපු සතුටෙන් මේ හදවත පිරිලා ඉතිරිලා ගිහින් නිසා වෙන්න ඇති, ඔයා නික්ම ගිහින් බව දැනෙද්දි ඒ සතුට ඇතුළෙන් පපුව තෙරපගෙන උඩට මතුවෙන ලොකු වේදනාවකින් මගේ හදවත කිරී ගැහිලා යන්නේ, ලොකු හුදකලාවකින්, කම්පනයකින්, බයකින් මුළු හදවත ම වැහිලා යන්නේ.

'මම ඔයාට ඇත්තක් කියන්න ද ලුසී? මම එකතු කරපු, ඔයා මට දීපු,

අපි දෙන්න ම ලබා ගත්තු ... ඒ හැම සතුටකටමත් වඩා මේ දුක මට ලොකු වේදනාවක්. ඒක මට දරාගන්න හරි අමාරුයි.'

මේ දුක නැති වෙලා යන්න නම් මම දන්නේ එක ම එක විදියයි ලූසී, මම දැන් කරන්න යන්නේ ඒක.

මම මේක නොකළොත්, මට බයයි අපි දෙන්න ම එකතු කරලා, මගේ හදවතේ ගබඩා කරපු ඒ සතුට නිසා ම මට හැමදාමත් පිච්චි පිච්චි ජීවත් වෙන්න වෙයි කියලා.

ආදරය කියන්නේ ලොකු වචනයක් ලූසී.

මම නැගිට්ටා. තවත් දණ ගහගෙන ඉන්න එකේ තේරුමක් නෑ. මේ විදියට දණ ගහගෙන 'මගේ ලූසී මටත් වඩා දිග කාලයක්, බොහෝ ම සතුටින් ජීවත් වෙන්න ඕන' කියලා මම කොයි තරම් නම් දෙවියන්ගෙන් ඉල්ලලා තියෙනව ද? ඒත් එහෙම ඉල්ලපු දෙවියන් ම මගේ ලූසීව මගෙන් අරගත්තා.

ඒ අතින් මිනිස්සු වන අපි හරි ම අසරණ යි. අපි හැම මොහොතෙ ම අපිට වඩා බලගතු දෙයක් ගැන විශ්වාස කරනවා. අපි ඒ විශ්වාසය තුළින් ශක්තියක් ලබනවා. ඒ විශ්වාසය ගැන බලාපොරොත්තු තියා ගන්නවා. ඒම බලාපොරොත්තු තියාගෙනත් ඒ සේරම වෙනස් වෙලා ගියොත් අපි හිතනවා 'ඒක ඒම වෙන්න තිබුණ දෙයක්', 'දෙවියන් ඒ දේ කළේ අපේ ම හොඳටයි' කියල. ප්‍රාර්ථනාව, විශ්වාසයකටත්, විශ්වාසය බලාපොරොත්තුවකටත්, බලාපොරොත්තුව අහිමි වී ගිය තැන එය තවත් විශ්වාසයකටත් අපි පෙරළ ගන්නවා.

මේ හැම දේම ඇස් බැන්දුමක් වගේ. මම දන්නෑ දෙවියන් ඇත්තටම ඉන්නව ද කියලා. ඒත් මම විශ්වාස කරනවා අපි නොදන්න, අපිට නොපෙනෙන මොකක් හරි ලොකු බලයක් මේ විශ්වය තුළ තියෙනවා... ඒ බලය අපිව ජීවත් කරනවා.

'ඒක ආදරය වෙන්න බැරි ද මිත්‍ර?"

'හ්ම් වෙන්න පුළුවන් ලූසී, ඒත් මට දැන් ඒ ගැන හිතන්න ඕන කමක් නෑ, මොන දේ මොන විදියට හිතුවත් ඒ හැම දේම අවසන් වෙන්නේ ඔයාගෙන්.. ඒ නිසා මම දැන් යන්න ඕන'

'ඔයා කොහේට ද යන්න යන්නේ?'

මම දණ ගහලා හිටිය තැනින් නැගිටලා එතැන ම තිබුණු දිගු පුටුව උඩ ඉඳගත්තා. මගේ ඉස්සරහා ජේසුගේ කුරුසේ, ජේසූ අත් දෙකත් දෙපැත්තට විහිදගෙන ඒ කුරුසයේ ඉඳන් මගේ දිහා බලාගෙන ඉන්නවා... ඒත් ඊටත් වඩා.. මට දැනෙනවා මගේ ලුසී මගේ ළඟින් ම ඉන්නව වගේ... එයා මගෙත් එක්ක කතා කරනවා.

'මම යනවා පල්ලියේ පාලමට.'

'මොනවට ද?'

මම දන්නවා මොනවට ද කියලා. ඒත් ඒක මට කටින් පිටකරන්න බෑ. මගේ ලුසී මාව ජීවත් කරවන්න උත්සහා කළා මිසක් මම මැරෙනවට එයා කොහෙත් ම කැමති වෙන්නේ නෑ. මම කොහොමද එයාට කියන්නේ 'මට මැරෙන්න ඕන' කියලා.

'දන්නෑ... මට පාලම උඩට යන්න ඕන'

මම ඒම කියලා නැගිට්ටා.

මම දන්නවා ලුසී මගේ ළඟ නෑ.

❦

මමයි, ලුසීයි විවාහ වුණේ මේ පල්ලියේ අර පේන අල්තාරය ඉස්සරහා. ඒ අල්තාරය යට මමයි, එයයි දිවුරුම් දුන්නා. 'ජීවිතය තුරාමත්, මරණයෙන් පසුවත් අපි එක ම හදවතකින් ජීවත් වෙනවා කියලා'

මම අද ආවේ ඒ පොරොන්දුව ඉෂ්ට කරන්න.

'ඒත් මරණයෙන් පසුවත් එකට ඉන්නවයි කියන එකේ තේරුම - මම මැරුණ නිසා ඔයත් මැරෙන්න ඕනෙයි කියන එක නෙමෙයි මිත්‍ර'

මට තව ම එයාගේ කටහඬ ඇහෙනවා.

මම ඉන්නේ අල්තාරය දිහා බලාගෙන. ඒත් මට දකුණු පැත්තෙන්,

(එයා හැමදාම ඉඳගන්නේ මගේ දකුණු පැත්තෙන් - ඒ නිසා වෙන්න ඇති මේ මොහොතෙත් මට එයා කතා කරනවා ඇහෙන්නේ මගේ දකුණු පැත්තෙන්)

නැහැ මට ඒකට ඇහුම්කන් දෙන්න ඕන නෑ.

'මට ඔයාට ඇහුම්කන් දෙන්න ඕන නෑ ලූසී' මම ඔයාට ඇහුම්කන් දුන්නොත් ඔයා මාව ආයෙමත් ජීවත් කරවයි. ඔයා නැති වේදනාව විඳගෙන මට ජීවත් වෙන හැටි කියලා දෙයි. ඒත් මට ඒම ඕන නෑ... මට ජීවත් වෙන්න ඕන ඔයත් එක්ක. ඔයා කොහේ හරි ඉන්නව නම් මට ඔයා ඒ ඉන්න තැන ඔයත් එක්ක ම ඉන්න ඕනේ.'

'ඉතින් ඔයා ඉන්නේ මගෙත් එක්කනේ?... මම දැන් ඔයා ළඟ... මේ බංකුවේ ඔයාට දකුණු පැත්තෙන්'

'ලූසී...ඕක නවත්තන්න'

මම ඔළුවට අත්දෙක තියාගත්තා. මගේ ඔළුව පුපුරන්න වගේ. මගේ ඇස් කඳුළුවලින් ම වේළිලා ගිහින්, මම නැගිටින්න හැදුවා, ඒත් බෑ. මගේ කකුල් දෙක වෙවුලනවා..

'ලූසී මට යන්න දෙන්න... මාව නවත්තන්න එපා.. කරුණාකරලා මට යන්න දෙන්න' මම හිමිහිට මිමුනුවා.

'මේ පල්ලිය ඇරපු හැටිය ම නිසා පල්ලිය ඇතුළේ කවුරුත් නෑ. මමයි ඇතින් කුරුසයේ ඉන්න ජේසුයි විතරයි. ඒත් තව ටිකකින් මිනිස්සු එයි. ඒ එද්දි මම මෙතැන තනියම කතා කර කර ඉන්නවා දැක්කොත් ඒ මිනිස්සු හිතයි මම පිස්සෙක් කියලා. ඔයා මැරුණු දුකට මම පිස්සෙක් වෙලා කියලා... මේ පල්ලිය ළඟ ජීවත් වෙන මිනිස්සු හැමෝම වගේ අපිව අඳුරනවා'

මම මිමුනුවා. මගේ කටින් පිටවෙන වචනවල සද්දේ එළියේ වැටෙන වැහි පොදත් එක්ක මගේ කන් දෙකට ඇහෙනවා.

ඔව්... එළියේ වහිනවා.. හෝ ගහලා වහිනවා.. අන්ධකාර ආකාශය ගිගුරුම් දිදී වහිනවා... මට ඒ සද්දේ ඇහෙනවා... ආකාශය වැලපෙන සද්දේ... වේදනාවෙන් මිරිකිලා බර වෙලා පිරිලා ගිය ආකාශය ඒ වේදනාව පිටකරමින් මහ හයියෙන් වැලපෙන සද්දේ.

මම පල්ලියට ආවේ අන්තිම වතාවටත් දෙවියන් වැඳලා එක ම එක දෙයක් ඉල්ලන්න..

මම නැගිට්ට හැටියෙ ම ආයෙමත් කුරුසය දිහා බැලුවා.

'ජේසූ... මට එයාව මුණගස්සන්න.. මගේ ආත්මය මේ ලෝකෙන් නිදහස් වෙලා ආකාශයට යද්දි ම එයාගේ ආත්මය මේ ආකාශයේ කොහේදි ම හරි මට ආයෙමත් මුණ ගස්සන්න' මම අන්තිම වතාවටත් පපුවට අත් දෙකත් තියාගනිමින් දෙවියන්ගෙන් ඉල්ලුවා.

'ඇති.. මේ ඇති..'

මගේ ඔළුව සැරෙන් සැරේ දකුණු පැත්තට හැරෙනවා. මම දන්නවා මම ඒ පැත්තට ඇහුම්කන් දුන්නොත් එයා තවත් මොනව හරි කියනවා.

ඕන නෑ...

මම ඇවිද්දා.. පුළුවන් තරම් වේගයෙන් ඇවිදගෙන පල්ලියෙන් දොර ළඟට ආවා. මෙතැන ඉඳන් අර පේන දුරින් තියෙන්නේ ශාන්ත බර්නාඩ් පල්ලියේ පාලම.

ගොඩක් මිනිස්සු ඒකට කියන්නේ 'බර්නාඩ් පාලම' කියලා. මොකද ඒ පාලම හරහා තමයි නගරයේ ඉඳන් බර්නාඩ් පල්ලියට එන්න තියෙන්නේ. මේක ගොඩක් ඉස්සර ශත වර්ෂ ගාණකට කලින් හදපු පාලමක්. බර්නාඩ් පාලම කියනවා වගේ ම මේ පාලම තවත් නමකිනුත් ප්‍රසිද්ධ යි.

'සියදිවි නසා ගැනීමේ පාලම'.

❦

මම පල්ලියේ දොරෙන් එළියට එද්දි ම හුළං පාරත් එක්ක ගසාගෙන ආපු වැහිකඩ රොත්තක් ම මගේ ඇඟේ වැදුණා. මාව ශීතලින් වැහිලා ගියා. උදේ හතට ළං වුණත් තවමත් ආකාශය අන්ධකාර යි. වැස්ස නිසා වෙන්න ඇති. මේ වෙලාවට ආලොකමත් වෙන්න ඕන ආකාශය අන්ධකාරයෙන් ම වැහිලා ගිහින්, වැස්සත් එක්ක ම අහසින් පහත් වෙන අකුණුවල ස්වේත වර්ණ ඉරි පොළොව තෙක් ම වේගයෙන් ඇදිලා එනවා.

මම කකුලක් එළියට තියලා මහා වැස්සෙ ම ඇවිදින්න ගත්තා. ඒ අතර මම දැක්කා තුන් දෙනෙක් පල්ලිය පැත්තට ඇවිදගෙන එනවා. ඔව් තුන් දෙනෙක්, අම්මයි, තාත්තයි ඒ දෙන්නගේ අත අල්ලගෙන මැදට වෙලා එන පුංචි ගැහැනු දරුවකු යි. ඒ තුන් දෙනා ම වැස්සෙ ම තෙම් තෙම් පල්ලිය දිහාවට එනවා. වහිනවා කියලා ගානක්වත් නැතිව. මම අකුණු ගහන ආකාශය දිහා බලාගෙන ඔළුවට අතකුත් තියාගෙන නැවතුණා.

"වහිනවා... ඉක්මනට ඇතුළට එන්න, ඔය දරුවව වැස්සේ තෙමවන්න එපා" මම කෑ ගහලා කිවුවා.

ඒත් ඔවුන් ඒ ගැන කිසිම සැලකිල්ලක් නෑ. මම කිවුව දේ ගැන ගානක්වත් නැතිව ඒ ආපු විදියට ම හිමින් සීරුවේ දරුවගේ අතින් අල්ලගෙන පල්ලියට එනවා. මම නැවතිලා බලාගෙන හිටියා.

"වහිනවානේ පව් ඔය දරුවා" මම ආයෙමත් කිවුවා.

ඒත් ඒ අම්මයි, තාත්තයි මගේ මුහුණ දිහා බැලුවේ පුදුමයෙන්. ඔවුන්ගේ ඇස්වල තිබුණේ මොකක් ම හරි අමුත්තක්. පල්ලියට යන ගමන් පුංචි දූ පොඩ්ඩත් මගේ දිහාට හැරුණා. හරියට මොකක් ම හරි දෙයක් මට කියන්න වගේ.

ඒ අය මාව පහුකරගෙන යද්දි ම මට ඇහුණා ඒ ගැහැනු කෙනා කියනවා.

"කොහේද අනේ වැස්සක් මේ ඉරත් පායලා තියෙද්දී, පිස්සුනේ ඒ මනුස්සයට" කියලා.

මම ඇවිද්දා. පාලම දිහාට වේගයෙන් ඇවිද්දා. උදේ හය වෙද්දි ම පාලම උඩට පොලිසියේ කෙනෙක් මුරට එනවා මේකෙන් පහතට පනින මිනිස්සුන්ව ආරක්ෂා කරන්න. ඒත් ඔහු මේ මොහොතේ නැහැ... වැස්ස නිසා ඒ මනුස්සයත් කොහේට හරි මුවා වෙලා ඇති.

මම පාලම උඩට එද්දිත් මාව හොඳට තෙත බරිත වෙලා.. හුළං පාරත් වැඩි නිසා දරාගන්න බැරි තරම් ශීතලයි. ශීතල වැඩි කමට ම ඇඳගෙන හිටපු කබායත් මම තවත් ටිකක් ඇඟට තද කරගත්තා.

තව ටිකයි... ඔව් තව ටිකයි.

පාලම මැද... මේකට හොඳ ම තැන පාලම මැද.

කෝට් කබායත් ඇඟට තද කරගෙන මම පාලම මැදට ආවා. ඇවිත් පාලමේ යකඩ ආධාරකයත් අල්ලගෙන හිටගත්තා.

හ්ම්.. මෙතැන තමයි තැන... මෙතැන ඉඳන් පහත බැලුව ම පේන්නේ ආගාධය, ගැඹුරු 'බර්නාඩ්' ආගාධය...

මාක් ට්වේන් කියලා තියෙනවා 'මම මරණයට බය නෑ, මම මැරුණේ, මම ඉපදෙන්නත් අවුරුදු බිලියන... බිලියන ගාණකට කලින්' කියලා... මමත් ඒමයි... මමත් මරණයට බය නෑ. මම ඉපදුණු දවසේ ඉඳන් මැරි මැරි ජීවත් වෙච්ච මිනිහෙක්. ලූසීගේ මරණයෙන් පස්සේ සම්පූර්ණයෙන් ම මැරිලා ගිය මිනිහෙක්. දැන් මට තියෙන්නේ මගේ ඔළුවට සැරෙන් සැරේ කතා කරන 'අතීතයේ සතුටත්, වර්තමානයේ වේදනාවත්, නිස්සාරණ අනාගතයෙන්' පිරිලා ගිය මේ ප්‍රාණයත් විතරයි.

ඔව් ජීවිතය සදාකාලිකයි. මරණය ඒ ජීවිතයෙන් එක මොහොතක් විතරයි.

මම ආධාරකයට අත් දෙක තියාගෙන ලොකු හුස්මක් ඉහළට ඇදලා

ගත්තා. ජීවිතය කියන්නෙත් පුදුමාකාර දෙයක්. මම මේ හුස්ම ගත්තේ තවත් කෙනෙක් පිටකරපු හුස්ම පොදක්. මිනිස්සු හුස්ම පිටකරද්දි කාබන්ඩයොක්සයිට් විතරක් නෙමෙයි ඔක්සිජනුත් පිටකරනවා. ඒ පිටකරන හුස්ම මේ පෘතුවියේ වසර මිලියන ගාණක් ශරීර පෝෂණය කරමින් ආයෙමත් ඒ ශරීර ඇතුළින් ම පිටතට එනවා. ඒම බැලුව ම මම මේ මොහොතේ ඉහළට ඇදලා ගත්ත හුස්ම ඇතුළේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කුරුසයේ දි පිටකළ අවසන් හුස්ම තියෙන්න පුළුවන්, බුදුහාමුදුරුවෝ බුද්ධත්වයට පත්වූ මොහොතේ පිටකළ හුස්මවල අංශු මාත්‍රයක් හෝ තියෙන්නට පුළුවන්. මගේ ලුසි මාත් එක්ක මේ බර්නාඩ් පාලම උඩින් ඇවිද යද්දි පිටකළ ස්වසනයක - එයා සතුටු වුණු ඒ මොහොතවල්වල පිටකළ - සතුටු මාත්‍රයක් තියෙන්නත් පුළුවන්.

ලුසීව මතක් වෙද්දි මම ආයෙමත් පාලම තදින් අල්ලගත්තා.

මට කොහොමත් එයාව අමතක කරන්න බෑ. මම ජීවත් වෙලා හිටියොත් මම ගත කරන හැම මොහෝතක ම ලුසී ගැන හිතන්න පටන් ගනීවි. මම මොන දේ කොහොම හිතුවත් අවසානයේ දි ඒ හැම දෙයක් ම මගේ ලුසී ගැන ඇතිවන මතකයකින් අවසන් වෙලා යයි. ඒ මතකය මගේ හදවත තවත් වේදනාවට පත් කරමින් මාව උන්මත්තකයෙක් කරයි.

'නෑ... මට ඒ ජීවිතය ඕන නෑ ලුසී.'

මම දන්නවා මේ මොහොතේ මම නතර වුණොත් අදින් පස්සේ ඇරඹෙන ඒ ජීවිතය, ජීවත් වෙන හැම තත්පරයක ම මාව සියදහස් වාරයක් මරා දමන බව.

ඒ සිතුවිලිත් එක්ක ම මම පාලම උඩට කකුලක් තිබ්බා. මගේ මුළු ශරීරය ම තෙත් වෙලා. ආකාශයේ අන්ධකාරය යි, ආගාධයේ අන්ධකාරය යි හැරුණු කොට යාන්තමින් හරි ආලෝකයකට පේන්නේ අකුණු සැරෙන් පිටවෙන ස්වේත වර්ණ විදුලි ධාරාවන් විතරයි.

'ඔබ වහන්සේ මට ලුසීව මුණගස්සන්න ඕන'

මම පාලමට ශරීරය තවත් ටිකක් බර කළා.

මම මේ වෙනුවෙන් දවස් කිහිපයක් බලාගෙන හිටියා - නෑ මාස කිහිපයක්, සමහර විට අවුරුද්දක් - මම දන්නෑ මට හරියට මතක නෑ. ඒ හැම මොහොතක ම මම මේ අන්ධකාර වර්ෂාව මැද්දේ බර්නාඩ් පාලම උඩට ඇවිත්, මේ විදියට පාලමෙන් පනින විදිය ගැන සිහින මැවුවා.

දැන් ඒ සිහිනය ඉටුවෙන්න යන්නේ...

ඒත් මේ මොහොතේ මගේ හිතට ලොකු වෙහෙසක් දැනෙනවා. මනසේ

ස්නායු තන්තු ඔළුවෙන් පිටට එන්න තරම් රිදෙන්න ගන්නවා... ඇයි ඒ?

'ඔයාට හොඳට ම විශ්වාස ද ඔයා මැරුණොත් ඔයාට මාව ආයේ දකින්න පුළුවන් වෙයි කියලා?' මට ලූසීව ආයෙත් ඇහෙනවා.

මම ඔළුව අල්ලගත්තා.

'ඔව්... මම ඒම හිතාගෙන ම මැරෙනවා, ඒම හිතාගෙන ම මැරුණොත් මට විශ්වාසයි ඔයාව ආයෙත් දකින්න පුළුවන් වෙයි.'

එයා හිනාවෙනවා... වර්ෂාවේ අකුණු පහරත් එක්ක ම ඒ හිනාවත් මගේ කන් දෙකේ තෙරපෙනවා.

'ඔයා කොහොමද රත්තරං හරියට ම එහෙම කියන්නේ, පොඩ්ඩක් හිතන්නකෝ, මම දැන් ඔයා ළඟ ඉදිද්දි ඔයාට අඩු ම තරමින් මාව ඇහෙනවනේ, අපි දෙන්නා එකට ගත කරපු හැම මොහොතක ම මතකයන් ඔයා ළඟ තියෙනවනේ, නේද.. ඔයාට ඒ මතකයන් එක්ක ජීවත් වෙන්න හරි පුළුවන්නේ.. ඒත් ඔයා මැරුණොත්? ඔය මතකයන් සේරම ඔයාගේ මනසින් වියැකිලා ගියොත්, ඔයා කොහොමද ආයේ මේ ලූසීව මතක් කරන්නේ?'

'ලූසී...' මම ඔළුව දැතින් ම බදාගත්තා.

මගේ ඔළුව පුපුරන්න වගේ... ඔළුවේ නහරවල් එළියට පනින්න තරම් වේදනා යි. අනික මේ අකුණු පුපුරන සද්දේ... ඒ සද්දෙත් එක්ක ම පහතින් පේන ආගාධය තව තවත් අන්ධකාර වෙනවා.

'ඔයා මේ දේ කරගත්තොත්, ඔයාට මාව ආයේ දකින්න තියා, මං ගැන හිතන්නවත් ලැබෙන්නෑ රත්තරං, ඒ නිසා ඔය දේ කරන්න එපා'

'බෑ ලූසී... මට ජීවත් වෙන්න බෑ... ඔයා ගියාට පස්සේ මම හැම දවසෙ ම ජීවත් වුණේ මේ විදියට... මේක ජීවිතයක් නෙමෙයි අපායක්, මට මේ විදියට තවත් ජීවත් වෙන්න බෑ... කරුණාකරලා මට මේ දේ කරගන්න ඉඩ දෙන්න ලූසී, මං වෙනුවෙන්, අපි දෙන්නගේ ආදරේ වෙනුවෙන්... ඔව් මේ පල්ලියේ ම අපි දෙන්නා එකට දිවුරපු ඒ ආදරය වෙනුවෙන්, කරුණාකරලා...'

තවත් එයාට ඇහුම්කන් දෙන්න ඕන නෑ. මම ඔළුවෙන් අත අරගෙන ආයෙමත් පාලමට තියලා අනිත් කකුලත් ඉහළට එසෙවුවා.

මම තවත් එක මොහොතක් හරි ජීවත් වෙලා හිටියොත් මගේ ලූසී මොන ම විදියකින් හරි මාව ජීවත් කරවනවා. මම ඒක දන්නවා. එයාට මේ විදියට මගේ ළඟ ඉන්න පුළුවන් නම් මේ ජීවිතයෙන් පස්සේ මටත් එයා ළඟ ඉන්න බැරි කමක් නැනේ.

අනික... මම විශ්වාස කරනවා මරණයෙන් පස්සේ ජීවිතයක් තියෙනවා.

අපිට අපි ගොඩක් ආදරය කළ අයත් එක්ක ඒ ජීවිතය ලස්සනට ගත කරන්න පුළුවන්, අපිට අපි ඒ ආදරය කරපු අයව මුණ ගැහෙනවා, ඔව් ආයෙ මුණ ගැහෙනවා.. එතැන තියෙන්නේ සදාතනික ජීවිතයක්. මට කරන්න තියෙන්නේ හිතට අධිෂ්ඨානයක් ගන්න එක විතරයි. මගේ ආත්මය ශරීරයෙන් පිටවෙලා යන මොහොතෙත් එයා ගැන ම හිතන එක විතරයි.

'ඒක මහ මෝඩ අදහසක් මිත්‍ර, ඔයාට වේදනාව පළවා හරින්න බෑ, ඒත් ඒ වේදනාවත් එක්ක ජීවත් වෙන්න ඉගෙන ගන්න පුළුවන්'

'නෑ... මට ඒම ඕන නෑ'

මම ලොකු හුස්මක් උඩට අරගෙන හිතට ධෛර්යය ගත්තා.

'පැනපන් මිත්‍ර, පැනපන්'

මගේ ඉදිරියේ තියෙන අන්ධකාර බර්නාඩ් ආගාධය කෑ ගහනවා.

'ඔව් මම මේක කරනවා... ලුසී මම ඔයා ළඟට එනවා, තව ටිකකින් මම ඔයාව මුණ ගැහෙනවා'

මම තවත් හුස්මක් අරගෙන, ඇස් දෙකත් වහගෙන මගේ ලුසීව මගේ හදවතේ මවා ගත්තා. ඒ කොළ පාට ඇස් දෙක. ඒ රත්තරන් පාට කොණ්ඩය... ඒ මුහුණ... එයාගේ ලස්සන හිනාව...

'මම ඔයා ළඟට එනවා ලුසී'

ඒත් එක පාර ම -

අහස දෙදරලා යන තරම් මහා හයියෙන් ගහපු අකුණකින් මුළු ආකාශය ම ආලෝකමත් වුණා. ඇස් දෙක වහගෙන හිටියත් මට දැනුණා මගේ ඇස් තුළ ආලෝකය පිරිලා යනවා. මම ඇස් විවර කළා. අන්ධකාරය සම්පූර්ණයෙන් ම පහවෙලා ගිහින් හිරු එළියෙන් මුළු ප්‍රදේශය ම පිරිලා ඉතිරිලා ගියා.

මේක පුදුමයක්... ආශ්චර්යක්.. කොහොමද මෙහෙම වෙන්නේ? මෙච්චර වෙලා මහා දරුණු වර්ෂාවක් තිබ්බා, මේ බර්නාඩ් පාලම දෝරේ ගලාගෙන යන තරමට මහා වැස්සක් වැස්සා. ඒත් දැන්...

මම ඒ පුදුමයත් එක්කම මගේ ඇඳුම් දිහා බැලුවා. මීට මොහොතකට කලින් මේ ඇඳුම් තෙත් වෙලා තිබුණේ... වතුර ගලාගෙන යන තරමට තෙත් වෙලා තිබුණේ, ඒත් දැන්... නෑ... කිසිම තෙතක් නෑ.

මම ඇඳගෙන ඉන්නේ නිල් පාට ඩෙනිමක්, සුදු අත්දිග කමිසයක්. මම එක් අතකින් කමිසය අල්ලලා බැලුවා. නෑ... පොඩ්ඩක්වත් තෙත නෑ.

දෙවියනේ...

මාව තුෂ්ණිම්භූත වුණා. හදවත වෙළා ගත්ත ලොකු කම්පනයකින්, හිරි වැටීමකින්, මගේ ඔළුව පුපුරලා යන තරම් ලොකු වේදනාවකින් මාව වැහිලා ගියා.

මම දැතින් ම ඔළුව අල්ලගෙන පාලමෙන් පස්සට ගියා.

ඒත් එක්ක ම එතැන තිබුණු කොන්ක්‍රීට් කණුවකට හැප්පිලා මාව බිමට ඇදගෙන වැටුණා.

මම ආයෙත් නැගිටින්න උත්සහා කරද්දී... මම දැක්කා ඡායාවක්. ඔව්... මගේ ඇස් ආලෝකයට එක පාර ම නුහුරු නිසා වෙන්න ඇති මට ඇයව පෙනුණේ ඡායාවක් විදියට. ඇය පාලම දිගේ මගේ දිහාට එනවා.

ලූසී...

මගේ ලූසී...

මම ඇස් දෙක පුංචි කළා. ලූසීව හොඳට ම බලාගන්න ඕනෑවට දැතින් ම ඇස් දෙක පොඩි කරලා එයා දිහා බැලුවා..

දෙවියනේ... ඒ ලූසීමයි...

ඒ උස... ඒ මුහුණ...

හැබැයි ඇයට තියෙන්නේ කළු කොණ්ඩයක්ක එයා ඇඳගෙන ඉන්නේ ඩෙනිම් කලිසමක්.

නෑ ඒ ලූසී නෙමෙයි... ලූසී වෙන්න බෑ. ලූසී කැමති ගවුම්වලට... ලූසී ඩෙනිම් අඳින්නෑ... ඒත්... ඇය ලූසී වගේ... ඔව්.. ඒ වගේමයි.

ඇය මගේ ඉදිරියෙන් පාලම දිගේ ඇවිදගෙන ඇවිත් මාවත් පහු කරගෙන යන්න යනවා... ඒත් මම බිම වැටිලා හිටිය නිසා වෙන්න ඇති මගේ ළඟින් යද්දි එක පාර ම නැවතුණා.

"මහත්මයා... ඔබට උදව්වක් ඕනෙ ද?"

ඇය මගේ දිහාට නැඹුරු වුණා.

දෙවියනේ... ඒ ලූසීගේ ඇස් දෙකමයි. ඒ කොළ පාට ඇස් දෙකමයි... ඒ මුහුණමයි.

ඒත් කොණ්ඩේ.. ඇඳුම්...

මගේ ඇස් දෙක ගියේ එයාගේ කොණ්ඩෙට... මම එයා දිහා පුදුමයෙන් වගේ බලාගෙන ඉන්න ඇති.

"මහත්තයා... ඔබ හොඳින් ද? නැගිටින්න පුළුවන් ද?"

ඇය මගේ දිහාට අත දික් කරනවා, මාව නැගිට්ටවන්න.

"ඔව්.. ඔව්.. මම හොඳින්... මම හොඳින්... දැන් මම හොඳින්"

මම ඒම කියලා හිටගන්න හැදුවා.

"හා එහෙනම් කමක් නෑ... මම හිතුවේ ඔබට අනතුරක් කියලා"

"නෑ නෑ... මම හොඳින්"

මම ඒ මොහොතේ ආයෙමත් ආකාශය දිහා බැලුවා. හොඳට ම ඉර පායලා. හැම තැන ම ආලෝකයෙන් පිරිලා ගිහින්. පාලමට පහතින් තියෙන ආගාධයත් බොහෝ ම පැහැදිලිව පේනවා.

ඒත් මීට ටික වෙලාවකට කලින්... ඒ වැස්ස, ඒ අන්ධකාරය...

එතකොට මම මැරුණ ද? මේ මගේ ආත්මය ලුසීව මුණ ගැසුණ මොහොත ද? මම ආයෙමත් ඈ දිහා බැලුවා.

ඇය යනවා.

බොහෝ ම හිමින්, ලස්සන ගමනකින් ඇය මගෙන් ටිකෙන් ටික ඈතට යනවා.

මම පුදුමයෙන් වික්ෂිප්ත වෙලා ඈ දිහා බලාගෙන හිටියා.

නෑ... ඒම වෙන්න බෑ... මේ ලුසී නෙමෙයි.. මේ වෙන කෙනෙක්... ලුසී වගේ ඔව්, ඒත් වෙන කෙනෙක්..

මම මගේ අත කෙනිත්තුවා, ඇඟිලි පොඩි කළා, මට වේදනාව දැනෙනවා. ඔව්... මම ජීවත් වෙනවා. මම මැරිලා නෑ මම ජීවත් වෙනවා.

එතකොට මම මීට කලින් දැකපු දේවල්... ඒවා?

කමක් නෑ.... දැන් ඒ ගැන හිතන්න ඕන නෑ...

ඒ කෙල්ල දැන් ගොඩක් දුර ගිහින්... පාලමත් පහු කරගෙන මගෙන් ගොඩක් ඈතට ගිහින්... මම ජීවත් වෙනව නම් මට දැන් කරන්න තියෙන්නේ එක ම එක දෙයයි.

මම ලොකු ජවයක් අරගෙන හිටගත්තා. එයාගේ පස්සෙන් යන්න පටන් ගත්තා.

ඔව්... මට ඇයව නැති කරගන්න බෑ. එයා ලුසී වගේ... මගේ ලුසී වගේමයි. ඉතින් මම කොහොමද එයාව නැති කරගන්නේ?

'කවදාවත්ම - දරාගන්න බැරි තරමට ම ආදරය කරන්න එපා.'

ဘယ်ရွာသို့ ဘယ်လို

පාලම උඩ සිදුවීම මේ ආකාරයෙන් වෙද්දි - පාලමට පිටතින් ඇති කෙන්සිංග්ටනයේ ශාන්ත බර්නාඩ් මාවතේ නවත්වා ඇති ලින්කන් වර්ගයේ පැරණි කාර් රථයකි. මෙහි රියැදුරු ආසනයේ ඉඳගෙන සිටින පුද්ගලයා බර්නාඩ් පාලම හරහා ඇවිද එන එම කාන්තාව දෙසත්, ඈ පසුපසින් - ඇයව ලුහුබඳින - එම පුද්ගලයා දෙසත් බලාගෙන සිටියි. ඇය ඇවිදින්නේ අඩු වේගයකින් බැවින්, තවත් සුළු මොහොතකින් ම ඔහු ඈ ආසන්නයට ළඟා වෙනු ඇත. එසේ නැතහොත් ඔහු හිතාමතා ම වේගය අඩාල කොට ඇය ගමනාන්තයට ළඟා වන තෙක් ම ඈ පසුපස ම පැමිණෙනු ඇත.

කාර් රථයේ සිටි තැනැත්තා ඔහුගේ ජංගම දුරකතනයෙන් තරුණියට ඇමතුමක් ගත්තේ ය.

"ඩේසී, ඔහුට ළං වෙන්න දෙන්න එපා... තව ටිකක් වේගයෙන් ඇවිදින්න... ඔහු ළං වුණොත් ඔහුට අවධානය දෙන්නත් එපා. ඔහුව මඟ හරින්න... හරි වෙලාව එනකන් පුළුවන් තරම් මඟ හරින්න"

ඇය බර්නාඩ් මාවත දිගේ විත් කෙන්සිංග්ටන් ප්‍රධාන පාරට හැරුණා. මට ඇයව මඟ හැරගන්න බෑ. ඒ නිසාම මම දුවන්න පටන් ගත්තා. මම දුවද්දි මට තේරෙනවා ඇයත් වේගයෙන් ඇවිදිනවා. සමහර විට මම ඇයගේ පසුපස්සෙන් එනවා කියලා ඇයට දැනෙනවා ඇති.

මම නැවතුණා.

ඇයට මම ලුහුබඳිනවා කියලා දැනෙන්න දෙන්න බෑ. ඒම වුණොත් ඇය මං ගැන සැක කරන්න පටන් ගනියි. මට බය වෙයි.

'ආදරයේ දි කිසිම දෙයක් බලෙන් කරන්න එපා. යන වෙලාවට යන්න දෙන්න, එන වෙලාවට ළඟට ගන්න, ආදරේ හිතෙන වෙලාවට හොඳට ආදරේ කරන්න'

ලූසී මට ඒම කිවුවේ මම එයාට ආදරෙයි කියපු මුල් ම දවස්වල. ඒ වචන ටික මතක් වුණ නිසා වෙන්න ඇති, මම නැවතුණු තැන ම ඉඳන් වටපිට බැලුවා.

උදෑසන මේ තරම් ලස්සන ද? ඒම නැත්නම් මේ මට පේන විදිය ද?

කෙන්සිංග්ටන් මාවත අද වෙනදට වඩා ලස්සන යි. ගිම්හාන කාලය නිසා මිනිස්සු උදේ ම එළියට බැහැලා ඇවිදිනවා. පාර දිගට ම තියෙන කඩ සාප්පු එකිනෙක විවෘත කරනවා. මහා පාරේ සිංදු කියන මනුස්සයෙක් හා හා පුරා කියලා රස්සාව පටන් ගන්න ගිටාරයේ තත් පිරිමදිමින් තනු හරිගස්සනවා.

How would you like to sail away in the Bahamas

Just you and me girl

So far out in the sea where nobody can find us

Just the end of the world.

කෙල්ලේ,

ඔබ කැමති ද මා සමඟ 'බහමාස්'වලට යාත්‍රා කරන්න...

කාටවත් ම අපිව හොයාගන්න බැරි තරම් දුර ඈත මුහුදේ...

ලෝකයේ එහා කෙළවරේ තියෙන අනන්තයට

ඔයයි, මමයි විතරක්...

ඒ තත්වලින් ඇහෙන්නෙත් මම ලූසීට ආදරය කරන කාලේ නිතර ම ආසාවෙන් අහපු සිංදුවක්. ලයනල් රිචීගේ මේ සිංදුව නිසා ම මට ආසාවක් තිබුණා එයත් එක්ක බහමාස්වලට යන්න. ගිහින් නිවාඩුවක් ගත කරන්න.

'මේක ලස්සන උදෑසනක් ලූසී. අපි දෙන්නගේ මතකයන් එක්ක, මට ඔයා වගේ ම කෙනෙක් මුණ ගැහුණ ලස්සන උදෑසනක්'.

මම ආයෙමත් ඇතින් යන 'ඇය' දිහා බැලුවා.

එයා කෙන්සිංග්ටන් මාවත දිගේ ගිහින් හෝලන්ඩ් උද්‍යානය තියෙන ගේට්ටුවෙන් ඇතුළට යනවා. මම යළිත් ඇවිදින්න පටන් ගත්තා. එයා යන්නේ කොහේට වුණත් මම එයත් එක්ක ම යන්න ඕන. එයාව මඟ හැරගන්න හොඳ නෑ.

❧

හෝලන්ඩ් උයන කෙන්සිංග්ටන්වල තියෙන ලස්සන උයනක්. ගේට්ටුවෙන් ඇතුළු වුණා ම දිගට ම දෙවැනි ගේට්ටුව ළඟට යනතුරු ම තියෙන්නේ පටු මංතීරුව. උදේට මේ මංතීරුව දිගේ මිනිස්සු ව්‍යායාම් කරනවා. සමහරු බයිසිකල් පදිනවා, සුරතලුන්ව ඇවිදවනවා. එතැනින් එහාට තියෙන දෙවැනි ගේට්ටුවෙන් පස්සේ තමයි උයන පටන් ගන්නේ. උයනට ඇතුළුවෙන දෙවැනි ගේට්ටුව ළඟ ම අනිත් පැතිවලට යන්න තවත් පාරවල් තියෙනවා.

එයා ගේට්ටුවෙන් ඇතුළට ගියේ නැත්නම් ඒ අතුරු පාරකට හැරෙයි.

මම ඇවිද්දේ බොහෝ ම විමසිල්ලෙන්. ඇහි පිය ගැහුවොත් එයා එක් වර ම අතුරුදහන් වෙයි කියන බය මට තිබුණා. ඒ නිසා මම ඇස් දෙක වෙන කොහේටත් හරවන් නැතිව එයා දිහා බලාගෙන ම ඇවිද්දා. එයා ආවේ පල්ලියේ ඉඳන්. ඒ කියන්නේ එයා උදේ පාන්දර ම පල්ලියට ගිහින්

තියෙනවා. පල්ලිය තියෙන්නේ බර්නාඩ් පාලම කෙළවර නිසා එතැනින් එහාට කිසිම ගොඩනැගිල්ලක් නෑ. පල්ලියට එහා පසින් තියෙන්නෙත් ලඳු කැලෑව.

'ඔව්... ඒ කියන්නේ ඇය උදේ පාන්දර ම පල්ලියට යන්න ඇති. දැන් ඇය යන්නේ හෝලන්ඩ් උයනට නෙමෙයි, ඇයගේ නිවසට... ඒමත් නැත්නම්..'

මම ඇය යන දිහා බලාගෙන, ඇස් දෙක යාන්තමින් ඇතින් තියෙන තට්ටු දෙකේ ගොඩනැගිල්ලට හැරෙවුවා.

මම හිතන දේ හරි නම්.. ඇය යන්නේ...

මට ඒක හිතන්නවත් ලැබුණේ නෑ... ඇය අතුරුදහන් වුණා. නිසැකව ම එයා කෙළවරේ තියෙන අතුරු පාරකින් අර පේන ගොඩනැගිල්ල දිහාට හැරෙන්න ඇති.

ඒ සේෆ්ස්ටේ ගෙස්ට් හවුස් එක. මේක කෙන්සිංග්ටන්වල ජනප්‍රිය නවාතැන්පොළක්.

මම ආයෙමත් වේගයෙන් ඇවිද්දා. මම දැන් දන්නවා ඇය නැවතිලා ඉන්න තැන. ඇය ලංඩනයට ආපු අමුත්තෙක් වෙන්න ඕන. ඒම නැත්නම් ගෙස්ට් හවුස් එකක නැවතිලා ඉන්න විදියක් නෑ.

උයනේ දෙවැනි ගේට්ටුව ළඟට ඇවිත් මමත් ගේට්ටුව ළඟ ම තිබුණු අතුරු පාරට හැරුණා. ඒක දිගේ ම ඇතින් පේන්නේ දම් පාට ගොඩනැගිල්ල, සේෆ්ස්ටේ ගෙස්ට් හවුස් එක.

❧

'විශ්වය හැමෝටම ආදරය බෙදනවා මිත්‍ර ඒත් ගොඩක් අය ආදරය අඳුරගන්නෑ, ඒ අය ආදරය මඟ හැර ගන්නවා...'

ලුසී කවි ලියන්න ආසයි. ඒ නිසා එයා කතා කරන්නෙත් කවියක් වගේ.

'මට හැබැයි ඔයාව මඟ හැරුණේ නෑ... මම ඔයාව මගේ ළඟින් ම තියාගත්තා.'

මම යන ගමන් මිමුනුවා.

'මාව මඟ හැරුණේ නැති වුණාට, ඔයාට එයාව මඟ හැරෙන්න පුළුවන්, ඉක්මනට යන්න'

'හා'

මගේ මුහුණින් හිනාවක් මතුවුණා. මම හිතුවේ පාලමෙන් පස්සේ මට ලූසීගේ කටහඬ ආයෙමත් ඇහෙන් නැති වෙයි කියලා. නෑ... මට එයාව ඇහෙනවා.. හරියට එයා මගේ මනස ඇතුළේ ඉඳන් කනට කරලා කොඳුරනවා වගේ.

සේෆ්ස්ටේ ගෙස්ට් හවුස් එක පාට කරලා තියෙන්නේ දම් පාටින්. ගෙස්ට් හවුස් එකක් දම් පාටින් පාට කරලා තියෙනවා මම මේ දැක්කමයි. මේක බ්‍රිතාන්‍ය සම්ප්‍රදායික ක්‍රමයට හදපු පරණ බංගලාවක්. පසු කාලිනව ඒ බංගලාව ගෙස්ට් හවුස් එකක් කරලා. හෝලන්ඩ් පාක් එකේ ම භූමියක පිහිටලා තියෙන නිසා ගෙස්ට් හවුස් එකේ වටපිටාවත් හරි ම ලස්සන යි. ගස් වැල්වලින් පිරිලා. බංගලාව මැද ම පුටු මේස දාපු පොඩි උයනක් තියෙනවා. ඊට එහායින් වටේට ම ගොඩනැගිල්ල. මම ඒ දිහාවට එද්දි ම දැක්කා 'ඇය' රිසෙප්ෂන් එකේ ඉන්න ගැහැනු ළමයෙක් එක්ක කතා කරලා ඇතුළට යනවා. මමත් උයන දිගේ ගිහින් ඇය කතා කරපු රිසෙප්ෂන් එකේ කෙල්ල ළඟ නැවතුණා.

"සුබ උදෑසනක් සර්" එයා අප්‍රිකන් කෙල්ලෙක්.

"සුබ උදෑසනක්"

"සර්ට කාමරයක් ගන්න ද?"

"ඔව්" මම පිටුපස්ස බැලුවා. මේක නැවතුම් ශාලාව. උදේ කෑම වෙලාව නිසා අමුත්තන් බොහෝමයක් මේ ශාලාවේ තියෙන පුටුවල ඉඳගෙන කෑම ගන්නවා. ශාලාව පිටුපසට ම වෙන්න උඩු මහලට යන්න තරප්පු පෙළක් තියෙනවා.

"දැන් කලින් ඔයත් එක්ක කතා කරපු නෝනා... ඇය ඉන්නේ මොන කාමරේ ද?"

මට තේරුම් ගන්න බෑ මම ඇයි ඒම ඇහුවේ කියලා. මට තිබ්බේ ඒ ප්‍රශ්නෙ ම වෙන විදියකට අහන්න. මම එහෙම ඇහුව ගමන් ඒ කෙල්ල ඇස් දෙකත් ලොකු කරගෙන මගේ දිහා බැලුවා.

"සමාවෙන්න සර්, අපිට අමුත්තන්ගේ තොරතුරු දෙන්න බෑ"

"නෑ එයා අමුත්තෙක් නෙවෙයි"

"ඒ කිවුවේ.. ඔබ ඇයව අඳුරනව ද?"

"ඔව්, ඒ මගේ නෝනා... " ඒ වචනය එක පාර ම මගේ කටින් පිටවුණා. ඉබේ ම... කිසිම නැවතීමක් නැතිව.

"නෝනා?"

ඒ කෙල්ලට පුදුමයකට වඩා තියෙන්නේ සැකයක්. ඇය ඒ ප්‍රශ්නය අහන ගමන් මාව හොඳින් නිරීක්ෂණය කරනවා. ඒම නිරීක්ෂණය කරද්දි මට හිතුණේ ඒ කෙල්ලට මාව ඒ විදියට සැක කරන්න අයිතියක් නෑ කියලා.

"ඔව්... ඒ ලුසී, මගේ නෝනා, මට එයාව අමුත්තෙක් නෙමෙයි" මම ආයෙමත් කිවුවා. හැබැයි කලින්ට වඩා ස්ථිර විදියට.

"ලුසී?" ඇයත් ඒ නම ආයේ මුමුනලා පරිගණකය පරික්ෂා කරන්න ගත්තා. ටික වෙලාවකින් එයා ආයෙමත් ඔළුව ඉස්සුවා.

"සර් කිවුවේ ඇයගේ නම ලුසී කියල ද?"

ඒ ප්‍රශ්නෙත් එක්ක මාව ඉබේ ම ගොළු වුණා. මම නිහඬව ම ඒ කෙල්ල දිහා බලාගෙන කල්පනා කරන්න ගත්තා.

මම මොන මෝඩයෙක් ද? ඇයි මම ඒ නම කිවුවේ. එයාගේ නම ලුසී වෙන්න විදියක් නෑ. ඒම කොහොමද වෙන්නේ?.

මම නළලත් රැලි කරගෙන නිහඬව හිටියා.

මට තිබුණේ ඇය ගැන අහන්නැතිව මේ ගෙස්ට් හවුස් එකෙන් කාමරයක් කුලියට ගන්න. දැන් කරන්න දෙයක් නෑ. තව ටිකකින් මේ කෙල්ල ඒ නම වැරදියි කියලා දැනගත්තු හැටියෙ ම අතන දොර ළඟ ඉන්න මුරකාරයට කතා කරයි. ඊට පස්සේ මගෙන් ප්‍රශ්න කරන්න පටන් ගනියි.

(බ්‍රිතාන්‍යයේ නීති තදයි. කාට හරි අනතුරක් වෙන්න යනවයි කියන පොඩි සැකයක් ඇති වුණත්, මේ අය කෙළින් ම පොලිසියට පැමිණිලි කරනවා)

මම අනිත් පැත්ත හැරුණා.

තවත් මෙතැන ඉන්න ඕන නෑ. මගේ ඔළුව විකාරයක් වෙලා. පාලමෙන් පනින්න හදපු වෙලාවේ ඒ දේ කළා නම් ආයෙමත් මේවගේ ජීවත් වෙන්න ඕන නෑ. මම දැනගෙන හිටියා මේ දේ වෙනවයි කියලා. මම ජීවත් වෙන්න බය වුණෙත් ඒ නිසාමයි.

මෙතැනින් යන්න ඕන. ඇය පරිගණකයෙන් ඔළුව උස්සන්න කලින් මෙතැනින් පැනගන්න ඕන.

මම අඩියක් ඉස්සරහට තිබ්බා. දොර ගාව හිටිය මුරකරුවත් මම එනවා දැකලා දොර අරිනවා.

"සර් සර්.." මට එක පාර ම ඇහුණා ඒ කෙල්ල කතා කරනවා.

"ඔව්..."

"ඔබ කිවුවේ ලූසී කියලනේ?"

තව මොනවා කියන්න ද මම මුරකරුවා දිහාත් බලලා, ඔළුව වැනුවා.

"හරි... ඇය ලූසී තමයි" කෙල්ල මගේ දිහා බලලා දත් ටිකත් විළිස්සලා හිනාවුණා.

"සමාවෙන්න සර් මම නෝනා ගැන අහපු එකට. අපිට අමුත්තන්ගේ තොරතුරු පිට අයට දෙන්න බෑ, ඒකයි මම ඒ ගැන මේ තරම් විමසිලිමත් වුණේ"

"නෑ එකට කමක් නෑ"

මගේ හිතේ තියෙන්නේ පුදුම කුතුහලයක්. ඒත් මම ඒක පෙන්නන් නැතිව ඉන්න උත්සහා කළා.

'එයාගේ නමත් ලූසී?' ඒම කොහොමද වෙන්නේ... නෑ ඒක කොහෙත් ම වෙන්න බෑ..

"සර් නෝනා ඉන්නේ 207 වෙනි කාමරේ, මම කෝල් කරලා එන්න කියන්න ද?"

"නෑ නෑ ඒම ඕන නෑ "

මම ආයෙමත් කල්පනා කළා.. කෙල්ලත් ඇස් දෙකත් ලොකු කරගෙන මම තව මොනවා හරි කියනකන් මගේ මුහුණ දිහා බලාගෙන ඉන්නවා.

"එයා මගෙත් එක්ක තරහා වෙලා ගෙදරින් ආවේ" මම ඒම කියලා මගේ කලිසම් සාක්කුවට අත දැම්මා... වාසනාවට මගේ පසුම්බිය තවමත් කලිසම් සාක්කුවේ තියෙනවා. මම ඒක ඇරලා ක්‍රෙඩිට් කාඩ් එක අරගෙන මේසය උඩින් තිබ්බා.

"මට කාමරයක් දෙන්න, එයාගේ කාමරය ළඟින් ම නම් වඩාත් හොඳයි, එතකොට මට පුළුවන් එයාව ආයෙත් යහළු කරගන්න"

'පිරිමියකුට කරන්න පුළුවන් සුන්දර ම දේ මොකක්ද දන්නවද? ගැහැනියෙක්ට ඇහුම්කන් දෙක එක'

'ඔව් ඔයා හරි, ඔයා මට එයාව මඟ හැරගන්න එපා කිව්ව නිසා මම එයාව මඟ හැරගත්තේ නෑ' මම හිමිහිට මුමුණලා හිනාවුනා.

මට ඇහෙනවා මගේ ලූසීත් හිත ඇතුළෙන් යාන්තමින් හිනාවෙනවා.

කාමරයට ගිය හැටිය ම, මම එයාගේ කාමරෙයි, මගේ කාමරෙයි වෙන් කරන බිත්තිය ළඟින් ඉඳගත්තා. එයා මේ මොහොතේ මොනවා කරනවා ඇත්ද?

මම බිත්තියට ඔළුවත් තියාගෙන කල්පනා කළා. එයාගේ කාමරය 207, අර කෙල්ල මට දුන්නේ 206. 'සර් නෝනව යාළු කරගන්න' කියලා එයා 206 කාමරයේ යතුර මට දුන්නේ මගේ වචන ගැන ලොකු විශ්වාසයකින් වෙන්න ඇති.

'ඔයා කරන්නේ හොඳ දෙයක් නෙමෙයි මිත්‍ර, මං වගේ අය එක්කෙනෙක් නෙමෙයි සිය දහස් ගණනක් වුණත් ඔයාට මුණ ගැසේවී. ඉතින් ඔයා ඒ හැමෝවම මේ වගේ ලුහුබඳිනව ද?'

මට ඇහෙනවා ලුසී මට කතා කරනවා. මගේ ඔළුවට, මගේ ඔළුවේ තියෙන සියුම් නහර ඇතුළට එයා කොඳුරනවා.

'දන්නෑ ලුසී, ඔයාව දකින්න පුළුවන් හැම කෙනාව ම මම ලුහුබඳිනවා'

'එහෙත් ඒ ඉන්නේ මම නෙමේනේ?'

'ඔයා නෙමෙයි, ඒත් ඔයාගේ රූපය'

'ඉතින් ඇයි ඔයා මං නොවන මගේ රූපයක් හොයන්නේ?'

'ඔයාව ආයේ දකින්න ඕන නිසා, ඔයාට ආයෙත් ආදරය කරන්න ඕන නිසා...' මම නැවැත්තුවා... මම ඊළඟට කියන්න ගිය එක තමයි මට පිටකරන්න අපහසු ම වචනය.

'තව...?' මට ඇහෙනවා එයා අහනවා.

'තව... මම ඔයාට නොකියපු දේවල් ගොඩක් තියෙන නිසා'

'ඉතින් කියන්න මම අහගෙන ඉන්නේ'

'නෑ... ඔය ඉන්නේ ඔයා නෙමේ ලුසී, ඔය මම... මම මට ම කතා කරගන්නවා. මම ඒක දන්නවා'

මම ඔළුවට අත තියාගත්තා...

ඒත් එක්ක ම මට ඇහෙනවා - ඇය අඬනවා...

- නෑ ඒ මගේ මනසට කතා කරන ලුසී නෙමෙයි, එහා කාමරයේ ඉන්න ලුසී.. එයා අඬනවා, කාත් එක්ක හරි කතා කරන ගමන් එයා අඬනවා... එයා ඉන්නේ දුරකතන ඇමතුමක වෙන්න ඕන.

මම බිත්තියට කනත් තියාගෙන බොහෝ ම වුවමනාවෙන් අහගෙන

හිටියා. එයා කියන්නේ මොනවද කියලා මට ඇහෙන්නෑ. ඒත් එයා අඬන බැව් මට හොඳට ඇහෙනවා.

මම දැන් මොකක්ද කරන්නේ ?

මට ඕන එයාගේ කාමරයට යන්න. ගිහින් එයා ගැන හොයලා බලන්න. ඒත් ඒම කොහොමද කරන්නේ, එයා මං ගැන සැක හිතන්න පුළුවන්.

මම තවත් බිත්තියට කන තිබ්බා. එයා ඉන්නේ මොකක් හරි ලොකු දුකකින්. මට ඇහෙනවා එයා කාමරයේ එහාට මෙහාට ඇවිදිනවා. සමහර තැන්වල නැවතිලා අඬනවා. පව්... එයාට මොනවා වෙලා ද?

මගේ හදවත ලොකු අඳුරකින් වැහිලා ගියා.

සමහර විට එයා උදේ ම පල්ලියට යන්නත් ඇත්තේ ඒ වේදනාව නිසා.

බෑ... මට බලාගෙන ඉන්න බෑ...

'ලුසී... හැම වෙලේ ම මගේ ඔළුවට කතා කරන ඔයා ඇයි මේ වෙලාවේ නිහඬ, ඇයි ඔයාට මොකක් ම හරි කියන්න බැරි?'

'මම මොනවා කියන්න ද මිත්‍රා... මම මොකක් කිවුවත් මම දන්නවා ඔයා තව ටිකකින් එයාගේ දොරට ගිහින් තට්ටු කරනවා'

❧

ඔව්, මම එයාගේ දොරට ගිහින් තට්ටු කළා. හැබැයි කිසිම සැලසුමක් නැතුව. මට ඕන වුණේ එයා හොඳින් ද බලන්න. මම තට්ටු කරලා දොර ඉස්සරහා හිටගෙන හිටිය ඒ තත්පර දෙක තුන මට දැනුණේ මුළු ලෝකය ම මගේ ඉස්සරහා නතර වෙලා වගේ.

එයා දොර ඇරියා.

'ලුසී... ඔයාට මේ මොහොතේ එයාව බලන්න පුළුවන් නම් එයා දිහා බලලා කියන්න ඒ ඔයා නෙමෙයි කියලා.' මම එයා දිහා බලාගෙන මිමුනුවා.

එයාගේ ඇස් දෙකේ කඳුළු. දොර අරින්න කලින් එයා කඳුළු පිහද ගන්න ඇති. ඒත් තවමත් ඒ ඇස් කඳුළුවලින් රතු වෙලා.

"ඔව්?"

මම එයා දිහා බලාගෙන හිටියා. පුදුමයෙන්... ඒ වගේ ම බලහත්කාරයෙන් ම වසාගත් ශෝකයකින්.

"හලෝ මහත්මයා... ඔයා කවුද? ඇයි දොරට තට්ටු කළේ?"

මම පිළිතුරක් නොදුන් තැන, ඇය කලින්ටත් වඩා සද්දෙන් අහනවා.

"ඔබ හොඳින් ද?"

මම ඒම අහද්දි එයාගේ ඇස් දෙක වෙනස් වුණා. 'ලූසී පුදුම වෙද්දිත් ඒම වෙනවා, එයා කල්පනා කරද්දි, අඬද්දී, එයාගේ කොළ පාට ඇස්වලට දුඹුරු පැහැයක් එකතු වෙනවා.

- ඔව් ඔබ විශ්වාස කරන එකකුත් නෑ, කොළ පාට ඇස් තියෙන අයගේ හිතට දුකක් එකතු වුණා ම ඒ ඇස්වලට දුඹුරු පැහැයත් මිශ්‍ර වෙනවා.-

"ඔයා හොඳින් නෙමේනේ?" මම ආයෙමත් ඇහුවා.

"ඇයි අහන්නේ, ඔබ කවුද?"

"මම... මම... එහා කාමරයේ ඉන්නේ, මට ඇහුණා ඔබ අඬනවා... මම ඒකයි දොරට තට්ටු කළේ"

එයාගේ මුහුණ ලැජ්ජාවෙන් බර වුණා. ඒත් එක්ක ම මගේ ඇස් ගියේ කාමරයට. එයාගේ ඇඳ උඩ පොත් කිහිපයක් තියෙනවා.

"නෑ මම හොඳින්, ස්තූතියි ඇහුවට"

එහෙම කියලා එයා එක පාර ම දොර වහන්න හැදුවා. ඒත් මොකක් හරි හේතුවකට එයා ආයෙමත් දොර ඇරලා මගේ මුහුණ දිහා හොඳින් බැලුවා.

"ඔබනේ අද උදේ පාලම උඩ වැටිලා හිටියේ?" එයාගේ මුහුණේ තියෙන්නේ ප්‍රශ්නාර්ථයක්.

"ඔව්... ඒ මම... ඔබ මගෙන් ඒ මොහොතේ ඇහුවා මම හොඳින් ද කියලා... මම ඒකයි ඔබෙනුත් ඒ ප්‍රශ්නෙ ම ඇහුවේ"

ඇයගේ ඇස් ආයෙමත් දුඹුරු පාට වුණා. එයා කල්පනා කරනවා. මගේ වචනත් එක්ක පිළිතුරු දෙන්න ඕන විදිය එයා හිතනවා ඇති.

"හ්ම්, මම හොඳින්... මට පොඩි ප්‍රශ්නයක් තිබුණා.. ඒත් දැන් ඒක හරි... ඒක ඉවරයි... ඔබ මං ගැන හිතුවට ගොඩක් ස්තූතියි... එතකොට ඔබ ඉන්නේ එහා පැත්තේ කාමරේ ද?"

"ඔව්, අංක දෙසිය හය, මම ඒ කාමරේ කුලියට ගත්තා"

"එතකොට පාලම උඩ?"

"ආ අද උදේ" මම ඔළුව කැසුවා. "ඔව් පල්ලියේ ඉඳන් එද්දි පාලම උඩ දී මාව ඇදගෙන වැටුණා.. ඔබ මාව දැක්කේ ඒ වෙලාවේ"

"ආ... මම දැක්කා ඔබ පල්ලියෙත් ඉන්නවා?"

"ඒම ද මම පල්ලියේ වැඩි වෙලාවක් හිටියේ නෑ."

එයා මාව පල්ලියේ දි දැක්ක නම් සමහර විට මම තනියම කතා කරනවත් එයා දකින්න ඇති. මම ඇයගේ මුහුණ දිහා බැලුවේ සැකයෙන්. ඒත් නෑ...

එයා ඒ ගැන හිතන පාටක් පේන්න නෑ.

"පල්ලියේ ඉඳන් ආයෙත් එද්දි තමයි මාව වැටුණේ. ඒක පුදුම වැටීමක්, හරියට දෙවියන් කාව හරි මුණ ගස්සන්න ඕනෑවට මාව වැට්ටුවා වගේ"

මම ආයෙමත් කිවුවා. ඒත් මම ඒම කිවුවේ සමහර විට එක බොරුවක් තවත් බොරුවකින් වහගන්න වෙන්න ඇති. මම කැමති නෑ එයා මගේ හැම දේම දැනගන්නවට.

"ඒත් ඔයා වැටිලා හිටිය විදියට මම බය වුණා. මම ඒකමයි ඔයා ළඟට ඇවිත් කතා කළේ"

"ඔයා කතා කරපු නිසයි මට නැගිටින්න තරම් හයියක් ආවේ"

මම හිනාවුණා. ඇයගේ මුහුණෙනුත් යාන්තම් හිනාවක් ආවා.

"සමහර වෙලාවට දෙවියන් අපිව නැගිට්ටවන්න ම ඕන නිසා මිනිසුන්ව මුණ ගස්සනවා..." ඇය කිවුවා.

එයා කතා කරන විදිය ලස්සන යි. ලුසී වගේ.. වචන නවත්තන් නැතිව එක දිගට. ඒත් ඒ කටහඬ වෙනස්. ලුසීගේ කටහඬ ඇයට වඩා ටිකක් ගැඹුරු යි.

"ඒක ඇත්තක් නම් මම දෙවියන්ට ස්තුති වන්ත වෙනවා ඔයාව ඒ මොහොතේ මගේ ළඟට එවුවට"

මම කිවුවා. ඇය ඒකටත් යාන්තමින් හිනාවුණා. ඇයගේ හිනාව දකිද්දි ඊළඟට කියන්නේ මොකක්ද කියලා මට අමතක වෙලා යන්න ඇති. මම ඇයගේ තොල් දිහා බලාගෙන හිටියා. හරියට මොන ම මොහොතක හරි හාද්දක් දෙන්න වගේ.

එයාට ඒකට ලැජ්ජා හිතෙන්න ඇති. එයා ඇස් දෙක පහත් කරගෙන දොර තදින් අල්ලගත්තා.

"මම ඒනම්...."

එයා අහන්න යන්නේ 'දොර වහන්න ද?' කියලා.

නෑ මට තවත් ටිකක් වෙලා එයා එක්ක කතා කරන්න ඕනේ. මම ආයෙමත් බැලුවේ ඇඳ උඩ තියෙන පොත් දිහා.

"ඔයා පොත් කියවන්න කැමතියි වගේ?"

"ඔව්... ගොඩක්"

"හ්ම්... ලුසී වගේ" මම මිමුනුවා.

"මොකක්ද?"

"නෑ... මම කිවුවේ"

"ඔයා කිවුවේ ලූසී වගේ කියල ද?"

"ඔව්..." මම නළල රැලි කරගත්තා. (මම ඇයි ඒම කිවුවේ?)

"ලූසී... කවුද ඒ?"

"ලූසී මගේ බිරිඳ"

"හ්ම්" එයාගේ ඇස් එක පාර ම ලොකු වුණා. ඒවා කොළ ම කොළ පාට ඇස්. විටින් විට පාට වෙනස් කරන ලස්සන කොළ ඇස්.

"එතකොට ලූසී කියන්නේ ඔයාගේ බිරිඳ?"

"ඔව්... ලූසී මගේ බිරිඳ"

මම බලාගෙන හිටියේ ඇය 'මගේ නමත් ලූසී' කියනකන්. නෑ ඒත් එයා ඒම කිවුවේ නෑ. ඒ වෙනුවට එයා ඇහුවේ වෙනස් ම ප්‍රශ්නයක්.

"එතකොට ලූසීත් පොත් කියවන කෙනෙක් ද?"

"ඔව්.. විශේෂයෙන් ම කවි"

"කවි?"

ඇය යළිත් පුදුම වුණා.

"ඔව් කවි... එයා ගොඩක් ම කැමති යුරෝපීය කවියන්ට. වුල්ෆ්ගන්, කිප්ලින්ග්, එලියට්"

"හ්ම්...." ඇය මිමුනුවා.

"එතකොට ඔයා?"

"අර පොත් සේරම කවි පොත්" එයා ඇඳ උඩ තිබුණු පොත් ටික පෙන්නලා මගේ ඇස් දෙක දිහා බලාගෙන හිටියේ කිසිම අදහසක් නැතිව ඔහේ බලාගෙන ඉන්නවා වගේ.

ඇය එහෙම කියද්දි මගේ මුහුණෙන් පුංචි හිනාවක් මතුවුණා. ඒක හිනාවකටත් වැඩිය දුකක් වෙන්න ඇති.

මට ලූසීව ආයේ මුණ ගැහිලා තියෙනවා. ලූසී ම නොවුණත්, එයා ලූසී වගේ ම කෙනෙක්... කළු පාට කොණ්ඩේ රත්තරං පාට වුණා නම් මේ ලූසී ම තමයි.

ඉ

මම ආයෙමත් කාමරයට ආවේ ඇයත් එක්ක ම උදේ කෑමට පහත මාලයට යන බලාපොරොත්තුවෙන්. කාමරයට ඇවිත් මම ඉක්මනට ම වොෂ් එකක් දාගත්තා. ඒත් මට අඳින්න වෙනත් ඇඳුමක් නෑ. මගේ නිවස තියෙන්නේ මෙතැන ඉඳන් කිලෝමීටර් තුනක් විතර එහායින් තියෙන බර්නාඩ්වල. එයත් එක්ක ම උදේ කෑම අරගෙන, ඊට පස්සේ ගෙදරට ගිහින් ඇඳුම් ටිකකුත් ගේන්න ඕන.

අද... මේ මොහොතේ ඉඳන් මම ජීවත් වෙන්නේ මේ ගෙස්ට් හවුස් එකේ.

වොෂ් එකක් දාගෙන ඉක්මනට ම ඇවිත් මම දොර ළඟට වෙලා බලාගෙන හිටියා එයා එළියට එනකන්.

'ලුසී ඔයාට මතකද මට ඔයාව මුලින් ම මුණ ගැහුණ දවස?'

'ඔව්... මමත් හිටියේ මේ වගේ ම ගෙස්ට් හවුස් එකක. ඔයා මේ පැත්තේ කාමරේ, මම එහා පැත්තේ කාමරේ'

'හ්ම්' මගේ මුහුණින් ආවේ හිනාවක්. මම මගේ ඔළුවත් එක්ක ම කතා කරමින් හිනා වෙන එක පිස්සුවක් වුණාට සමහර වෙලාවට ඒ පිස්සුවත් එක්ක සිදුවෙන දේවල් හරි ම සුන්දර යි, මනස පුදුමාකාර විදියට හැඟීම්වලින් සංසුන් වෙනවා.

'එදත් මම මේ විදියට ම ඔයා එනකන් බලාගෙන හිටියා...'

'ඔව්... මම එළියට ආවේ පොතක් එක්ක'

ඒත් එක්ක ම මට ඇහුණා එහා පැත්තේ කාමරේ දොර ඇරෙනවා. මම කොණ්ඩෙත් අතකින් පස්සට කරගෙන, මගේ මුහුණ හිනාවකින් පුරවගත්තා. කාට ම හරි සතුටක් වෙනව නම් බොරුවට හිනාවෙන එක වරදක් නෙමෙයි.

එයා එළියට ආවා. ආකාශය වගේ ලා නිල් පාට ඩෙනිමකුයි, සුදු පාට බ්ලවුස් එකකුයි ඇඳගෙන.

හරියට ලා නිල් පාට ආකාශය පුරෝලා තියෙන වලාකුළු වගේ...

- එදා ලුසී එළියට ආවෙත් ඒ පාට ම ඇඳුමකින්. හැබැයි මොකක් හරි හේතුවක් නිසා මම එදා ලුසීට ඒක කිවුවේ නෑ.

'ඉතින් අද ඔයා ඒක මෙයාට කියන්න' මට ඇහෙනවා මගේ ඔළුව ඇතුළෙන් කොඳුරනවා.

"අපි යමු, සමාවෙන්න පරක්කු වුණාට" එළියට ආපු හැටිය ම එයා මගේ දිහා බලලා හිනා වුණා. නාපු ගමන් ම නිසා වෙන්න ඇති එයාගේ කොණ්ඩේ තවමත් තෙත යි. ඒ තෙත් බව නැති වෙන්න කොණ්ඩේ වටේ ඩෙනිමේ පාටින් ම සළුවක් ඔතලා.

එයා කාමරයේ දොර වහලා මගේ දිහාවට හැරෙද්දියි මම දැක්කේ 'එයාගේ අතේ පොතක් තියෙනවා'

"හරියට ලා නිල් පාට ආකාශේ පුරෝලා තියෙන සුදු පාට වලාකුළු වගේ" මම එයා දිහා බලාගෙන කිවුවා. එයාගේ කොළ පාට ඇස් ලොකු වුණා.

"මොකක්ද ඒ කිවුවේ?"

"ඔයා... හරියට ලා නිල් පාට ආකාශේ පුරෝලා තියෙන සුදු පාට වලාකුළක් වගේ"

ඇය හිනාවුණා. ඒක ලොකු හිනාවක්. මම මුල් ම වතාවටයි එයාගේ මුහුණින් ඒ තරම් ලොකු හිනාවක් දැක්කේ.

'අනේ මම එදා ලුසීටත් ඒක කිවුව නම්... එයත් කොයි තරම් සතුටු වෙයි ද?'

❧

අපි දෙන්නා තරප්පු පෙළ දිගේ පහතට යද්දි මම ගියේ එයාගේ පසුපසින්. මට ඕන වුණේ එයාගේ සුවඳ බලන්න. එයාගේ තෙත කොණ්ඩෙන් ඔර්චිඩ් මල් සුවඳක් එනවා. කොණ්ඩේ තෙත නිසා බිලවුස් එකේ උඩු කොටසත් යාන්තමින් තෙත් වෙලා. අඩි උස සෙරප්පු දෙක නිසා වෙන්න ඇති නිල් පාට ඩෙනිමත් යාන්තමට උඩට ඉස්සිලා එයාගේ පස්ස පැත්ත ලස්සනට පේනවා.

තරප්පු පෙළ අවසානයේ තියෙන්නේ වීදුරු දොරක්, ඒ දොර ළඟට යද්දි මම දැක්කා එයා වීදුරුවේ පේන ඡායාවෙන් මගේ දිහා බලනවා. මම ඒ වෙලාවෙ හිටියේ 'මට පේන - නමුත් නොපෙනන' ඒ අපූරු ශරීරය මෙනෙහි කරමින්. මගේ ලුසීත් මේ වගේමයි, කෙට්ටුයි, උසයි, එයාටත් තිබ්බේ මේ වගේ පොඩි පස්සක්. මම කැමතියි ඒකට... චාම්, සරලයි, වැඩි විලාසිතාවක් නැති වුණත්, හැම දේම හරි ගාණට ලස්සනට තියෙනවා.

එයා වීදුරුවෙන් මගේ දිහා බලද්දි මම බිම බලාගත්තා. ඒ ලැජ්ජාව නිසා